**ලුණුගල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

-----------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 දිනද ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් මස 27 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

**1.2** **මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ලුණුගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගත් ඡායා පිටපත් යන්ත්‍රයේ වටිනාකම වූ රු.198,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) පරිත්‍යාග වශයෙන් ලැබුණු රු.3,232,281 ක් වටිනා කැබ් රථය ද්විගණනය වී තිබුණි.

(ඇ) පරිත්‍යාග වශයෙන් ලැබී ඇති ගැල්වනයිස් කොඩි කණු 440 ක වටිනාකම වූ රු.487,142 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අවසාන තොගයේ වටිනාකම රු.81,325 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.140,595 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,836,638 ක් වන ජංගම ගිණුම් 02 ක හා ඉතුරුම් ගිණුමක ශේෂයන් වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(උ) පළාත් පාලන සේවකයින්ගේ විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවන ලද රු.275,000 ක් අවිනිශ්චිත ගිණුම තුළ ගලපා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුළදී දරන ලද රු.345,918 ක් වටිනා වියදම් 07 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සිදුකර නොතිබුණි.

1.3.2 **නොසැසඳු පාලන ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 02 කට අදාල ශේෂයන් සහ ඒවාට අදාල උපලේඛන හා පාලන ගිණුම් අනුව රු.270,214 කින් නොසැසඳුණි.

1.3.3 **අවිනිශ්චිත ගිණුම්**

--------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ රු.614,437 ක බැර ශේෂයක් පැවතුණි.

1.3.4 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

සභාව විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.11,303,040 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.4,710,561 ක් විය.

1.3.5 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

----------------------------------

රු. 5,317,618 ක් වටිනා ගිණුම් විෂයයන් 04 ක්, විස්තරාත්මක උපලේඛන සහ හිඟ හිටි ආදායම් ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.6 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
| --- | --- |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | |
| (i) 132(ඒ) හා (ඔ) වගන්ති | පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව අවසරයකින් වැය කළ යුතු විෂයයන් සඳහා සභාව අවස්ථා 8 කදී රු.98,359 ක් අමාත්‍යවරයාගේ අනුමැතිය රහිතව වියදම් කර තිබුණි. |
| (ii) 158, 159 වගන්ති | ඉකුත් වර්ෂයේ හිඟ ආදායම් රු.1,652,958 ක් හා සමාලෝචිත වර්ෂයේ රු.2,289,301 ක් අයකර ගැනීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371 | සමාලෝචිත වර්ෂයේ අවස්ථා 06 කදී ලබාදී තිබූ රු.78,000 ක අත්තිකාරම් 2016 සැප්තැම්බර් 30 දක්වා පියවා නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,373,220 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.746,535 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

---------------------

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 2.6 සිට සියයට 76 දක්වා වර්ධනය වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආදායම් අයකර ගැනීමේ ප්‍රතිශතය සියයට 30 සිට සියයට 70 දක්වා දුර්වල මට්ටමක පැවතුණි.

(ඇ) 2011 සිට 2015 දක්වා කාලයට අදාල සභාව සතු බදු දේපළ 08 වාර්ෂිකව බදුදීම වෙනුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට රු.1,868,193 ක බදු කුලියක් අයකරගෙන නොතිබුණි.

(ඈ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු නොකර මඩොල්සිම නගරයේ කඩ කාමර 21 සඳහා 2005 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන බදු කුලී අයකෙරෙමින් පැවතුණි.

(ඉ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) (අ) සහ (ආ) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපළ 15 ක් සම්බන්ධව කාර්තු 04 ඉක්මවූ හිඟ අක්කර බදු රු.57,995 ක මුදලක් අයකරගෙන නොතිබුණි.

(ඊ) සභා බල ප්‍රදේශයේ පවතින ව්‍යාපාර කර්මාන්ත 11 ක් සම්බන්ධව 1980 අංක 47, 1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත් හා අංක 1159/22 හා 22 නොවැම්බර් 2000 ගැසට් නිවේදනයේ විධිවිධාන අනුව පරිසර බලපත්‍ර ලබාදී නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

(අ) 2015 වර්ෂයේ දී අවස්ථා 06 කදී ලබාදෙන ලද එකතුව රු.78,000 ක් වූ අතුරු අග්‍රිම අත්තිකාරම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණු අතර, පියවීම් සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) සභාව සතු අත්ට්‍රැක්ටර් රථය අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ජංගම ගිණුමේ 2013 පෙබරවාරි සිට 2015 දෙසැම්බර් දක්වා රු.1,072,369 ක බැර ශේෂයක් අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇතත් වසර 03 ක කාලයක් කිසිම ආයෝජන මාර්ගයක නොයොදවා ජංගම ගිණුමක මෙම මුදල් රඳවාගෙන තිබීම හේතුවෙන් එම මුදල් නිශ්කාර්යව පැවතිණි.

3.2 **මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

--------------------------------

සභාව වෙත ලැබුණු ගැල්වනයිස් කොඩි කණු 440 න් වටිනාකම රු.194,857 ක් වූ කොඩි කණු 176 ක ඌනතාවයක් 2016 අගෝස්තු 18 දින භෞතික පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

4. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

---------------------------------------

4.1 **අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

------------------------------

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වන පරිච්ඡේදයේ 4:2 අනුව සෑම ආයතනයක්ම වාර්ෂිකව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර භාවිතා කළ යුතු වුවත්, සභාව ප්‍රවර්තන වර්ෂයේ දී එසේ කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

-----------------------

2015 වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.4 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

4.5. **වත්කම් කළමනාකරණය**

-----------------------------

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

(අ) 2014 සැප්තැම්බර් 09 දින මිලදී ගත් රු.99,590 ක් වටිනා සෙවිලි තහඩු 69 න් තහඩු 60 ක් නිශ්කාර්යව සභා භූමිය තුල ගබඩාකර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ දී මිලදී ගත් රු.11,500 ක් වූ ලීටර් 1000 ජල ටැංකියක් හා රු.47,000 කට මිලට ගත් ලීටර් 2000 ජල ටැංකි 02 ක් 2016 අගෝස්තු 16 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව සභා භූමියෙහි තබා තිබුණි.

(ඇ) 2014 අගෝස්තු මස පළාත් පාලන කොමසාරිස්ගෙන් ලැබී තිබූ රු.1,000,000 ක මුදලින් ව්‍යාපෘති 04 ක් සඳහා රු.992,200 ක මුදලක් වැයකර ජලනල හා උපකරණ ලබාගෙන තිබූ නමුත්, 2016 අගෝස්තු 18 දින වන විටත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් එම ජලනල හා උපකරණ නිෂ්කාර්යව සභා භූමියෙහි රඳවාගෙන තිබුණි.

5. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) තොග පාලනය